# ඩයිනොසෝර රස බැලු ක්ෂීරපායියෝ

**පූර්ව ක්ෂීරපායීන්, අන් සතුනගේ ගොදුරු පිණිස ම පමණක් වූ බියගුලු සත්ත්ව කොට්ඨාශයක් වූවේ ද? චීනයෙන් හමු වූ අපූරු පොසිල දෙකක් මඟින් මේ පිළිබඳ නවතම තොරතුරු රැසක් හෙළි වී තිබේ.**

ඩයිනොසෝරයන් මිහිමත තිදැල්ලේ හැසිරුණු ඈත අතීතයේ, අපගේ අතීත පූර්වජයන්, දරුණු සතුන් නිදිගත් රාත්‍රී කල හොර රහසේ එළියට බැස පැළෑටි හෝ කෘමි සතුන් ආහාරයට ගැනීමට වැඩි දෙයක් නොකළ බයාදු සතුන් වූ බවට මෙතෙක් විශ්වාසය විය. ධූම කේතුවක් ඇදවැටීමෙන් ඩයිනොසෝරයන් හදිසියේ මෙලොවින් තුරන් වීමත් සමග, පරිණාමයේ සුළු හෝ ගෞරවාන්විත ස්ථානයක්, ක්ෂීරපායීන් විසින් හිමිකරගතු ලැබුවා ද යන්න ඒ සමග ම වැළලී ගියේ ය. එහෙත්, පසුගිය ද මේ පසුබිම ක්‍රමයෙන් වෙනස් වූයේ, නේචර් සඟරාව මඟින් පොසිල දෙකක් පිළිබඳ ප්‍රකාශයට පත් කිරීමත් සමග ය. ඉන් එකක් නවතම විශේෂයක් වූ අතර, Repenomamus giganticus නම් විය.

ඩයිනෝසෝර යුගයේ ක්ෂීරපායින් කිසිවිටෙක ලේනකුට වඩා විශාල නොවූ බවට වූ මතය මේ පොසිලය හමුවීමත් සමග බිඳ වැටිණ. වසර බිලියන 130 කට පමණ පෙර ජීවත් වූ, මේ සත්ත්වයා, මධ්‍යම ප්‍රමාණයේ බල්ලකු හෝ විශාල ප්‍රමාණයේ බැජරයකු ගේ (Badger) (මුගටි වර්ගයට අයත් නිශාචර සිව්පාවෙක්) ප්‍රමාණයෙන් යුක්ත වූ අතර, බොහෝ දුරට මෙතෙක් හමු වූ ඩයිනෝසෝර යුගයට අයත් විශාලතම සත්ත්වයා ලෙස ද හඳුන්වා දිය හැකි ය.

දෙවැන්න, මීත් පෙර සොයාගත් Repenomamus robustus නම් විශේෂයේ නව නිදර්ශකයක් විය. මෙහිදී බිඳ වැටුණු අනෙක් මතය වූයේ, සැම විටම ක්ෂීරපායින් අනෙක් සතුන්ගේ "ගොදුරු බවට පත් විය" යන්න ය. මෙම සැකිල්ලෙහි, උදර ප්‍රදේශයේ වූ පොසිල කොටස්, ළදරු ඩයිනොසෝරයකු ගේ ශරීර කොටස්වලින් යුතු බවට අනාවරණය විය.

"මේ අනාවරණය ජීවිත කාලයට ම ලැබෙන එක් අවස්ථාවක්. මෙවැනි දේ නැවත හමුවේ යැයි අපේක්ෂා කළ නොහැකියි." නිව්යෝක් නගරයේ, ඇමරිකානු ස්වාභාවික ඉතිහාස කෞතුකාගාරයේ පොසිල විද්‍යාඥ ජින් මෙන්ග් සහ නේචර් සඟරාවෙහි සම කතුවරයා පවසා සිටී. ඇත්තවශයෙන් ම, මෙවැනි අනාවරණයවීමක් මෙන්ග් සහ ඔහුගේ සගයන් කිසිවිටෙක අපේක්ෂා නොකළහ. මෙහි දී කුඩා ප්‍රමාණයේ සැකිල්ල හමු වූයේ, දෙවසරකට පමණ පෙර චීනයේ, ලියාඕනිං ප්‍රාන්තයේ ලොව පොහොසත් ම පොසිල තට්ටු අතරිනි. බීජිං හී "Vertebrate Paleontology and Paleoanthropology" ආයතනයේ දී එය පරීක්ෂාවට ලක් කෙරිණ. "උදරයේ අන්තර්ගතය අප මුලින් ම දුටුවේ නැහැ" නේචර් සඟරාවෙහි ප්‍රධාන කර්තෘ ඉහත ආයතනය හා අනුබද්ධිත උපාධි ශිෂ්‍ය යෝමින්ග් හියු පැවසුවේය. උදරයේ අන්තර්ගතය පිළිබඳ පරීක්ෂාවෙන් අනතුරු, ඔවුන්ට වැටහී ගියේ, විද්‍යාවේ විජයග්‍රහණයකට ඔවුන් අතගසා ඇති බව ය.






R.GIGANTICUS
විශාල බැජරයකු හෝ මධ්‍යම ප්‍රමාණයේ බල්ලකු ගේ ප්‍රමාණයෙන් යුක්ත වූ මොවුන්, කුඩා ඩයිනොසෝරයන් මෙන් දිස් වී ඇත.

Repenomamus විශේෂයට අයත් වූවෝ විලෝපිකයන් බවට තවමත් විද්‍යාත්මකව සහතික වී නොමැත. නමුත්, ඔවුන්ගේ ශක්තිමත් දෙපා සහ තියුණු දත්, සැලකිල්ලට ගැනීමේ දී පෙනීයන්නේ එය සැබැවින් ම විය හැකි බව ය.

R.ROBUSTUS
මෙම පොසිලයේ අභ්‍යන්තරය පුදුම උපදවනසුළු ය. උදරය පෙදෙසෙහි වූ නොදිරවූ ආහාර කොටස් ශේෂයන් කුඩා ඩයිනොසෝරයකුට අයත් ඒවාවිය.

ටයිම් ඇසුරෙනි - ලලනි මායාදුන්න

"මුලින් දත් පරීක්ෂාවේ දී අප සිතුවේ, (සත්ත්වයාගේ අවසන් ආහාරවේල අනුව) ඒ ක්ෂීරපායියකු නොව, ඩයිනොසෝරයකු බවයි" හියු පවසා සිටී. එහෙත් වඩාත් සමීප පර්යේෂණයකින් විද්‍යාඥ කණ්ඩායමේ තීරණය වූයේ සත්ත්වයා ක්ෂීරපායියකු බවත් උගේ උදරයේ වූ ශේෂයන් එම ප්‍රදේශයේ වාසය කළ, ශාකභක්ෂක තරුණ සිටැකොසෝරයකුගේ (Psittacosaur) බවත් ය. උගේ ඇතැම් බාහු සහ පාද අස්ථි කොටස් තවමත් එකිනෙක හා බැඳී තිබීමෙන් අනුමාන කළ හැක්කේ, R. Robustus ඔවුන්ගේ ආහාරය හොඳින් විකීමෙන් තොරව විශාල කුට්ටි වශයෙන් ගිල දැමූ බව ය.

ඒ මඟින් සහතික වන්නේ, ඩයිනොසෝර යුගයේ විසූ එක් ක්ෂීරපායී සත්ත්වයකු හෝ මාංශ භක්ෂක වූ බව ය. එසේම R. giganticus යනු R. robustus ගේ සමීප ඥාතියකු බැවින් විශාල පරිමාණයේ සත්ත්ව විශේෂයක් මාංශ අනුභව කළ බවට අනුමාන කිරීම හේතු සහගත ය. තවදුරටත්, R. giganticus ගේ සැකිලි කොටස්, ඔවුන්ගේ කුඩා ඥාතීන් හමු වූ පොසිල තවාන්වලින් ම හමු වීමෙන් ද, හැඟී යන්නේ ඔවුන් සාමාන්‍ය කසළ බුදින්නන්ට වඩා ක්‍රියාකාරී විලෝපිකයන් බව ය.

"ඔවුන්ට තිබී ඇත්තේ "තස්මේනියන් ඩෙවිල්"(Tasmanian devil) සත්ත්වයකුගේ මෙන් පැත්තට නැමුණු කෙටි පාද සහිත ශක්තිමත් ශරීර ව්‍යූහයක්, උන්ට, වේගයෙන් ඇවිදීමේ හැකියාව (හරියටම දිවීමක් වැනි) තිබෙන්නට ඇති. ඇත්ත වශයෙන්ම කිවහොත් කිඹුලකුට වඩා හොඳින් චලනය වීමේ හැකියාව මේ සත්ත්වයින්ට තිබූ බවට සැක නැහැ" මෙන්ග් පවසා සිටී.

සියල්ල කැටිකර ගත් කල පෙනී යන්නේ, මෙකී සොයාගැනීම මඟින්, පූර්ව ක්ෂීරපායීන් කුඩා බියගුලු සතුන් බවට වූ මතය උඩුයටිකුරු වන බව ය. එසේම, විශාල සතුන්ගේ බවට අනුමාන කළ දත් සහ අස්ථි ශේෂයන් පිළිබඳ විශේෂ අනාවරණයන් ද මෙහිදී ක්‍රමයෙන් බිඳ වැටෙනු ඇත.

"සතුරන්ගෙන් බේරීම සඳහා සොයාගැනීමට අපහසු වන පරිදි ඔවුන් කුඩා වූවා හෝ ඩයිනොසොරයන් විසින් සැමවිටම එවක පාරිසරික ඉඩකඩ අයිතිකරගෙන සිටි බැවින් ඔවුන් කුඩා වූවා" ආදී වශයෙන් ක්ෂීරපායීන් ඉතා කුඩාවූයේ ඇයිදැයි පැහැදිලි කිරීමෙහිලා සිද්ධාන්ත තෙම්පරාදු කිරීම නැවැත්වීමට ද දැන් පොසිල විද්‍යාඥයන්ට හැකිවනු ඇත. මේ අනුව විශාල සත්ත්වයන් වෙනුවෙන් වෙන්ව තිබූ ඉඩකඩෙන් සුලු ප්‍රමාණයක් හෝ ක්ෂීරපායීන් විසින් ද පිරවූ බවට දැන් පැහැදිලි ය.

"එය ඇත්තෙන්ම පිළිගත හැකියි" ඩියුක් විශ්වවිද්‍යාලයේ පොසිල විද්‍යාඥ "ඇනී වේල්" එසේ පවසන්නේ නේචර් වාර්තාව කෙරෙහි සිය මතය පළකරමිනි. "එකම දඩයම වෙනුවෙන්, ඔවුන් ඩයිනොසෝරයන් සමඟ තරඟ කර තිබෙනවා එසේම, ඔවුන් ඩයිනොසෝරයන් ආහාරයට ගැනීමෙන්, ඩයිනොසෝරයන්ගේ පරිණාමය කෙරෙහි බලපෑමක් ඇති කළා වීමට ද පුළුවන්, එහෙත් ඒ කුමන ආකාරයේ බලපෑමක්දැයි අපට හරියටම කිව නොහැකියි" ඇය තවදුරටත් පවසා සිටී.

එය කෙසේ වෙතත්, මෙය මෙතෙක් සිදුවූ විශිෂ්ටතම සොයාගැනීමකි. එමඟින් ලැබෙන පිළිතුරුවලට වඩා අප හමුවේ පැන නැගෙන ප්‍රශ්න රැසකි. ඒවාට පිළිතුරු, ලියාඕනිං ප්‍රදේශයේ කණීන ලද මතු පිටට යටින් සැඟවී තිබෙනවා වන්නට ද පුළුවන. ❑